පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 79

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල

පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 79

நிறுவனத்தின் பெயர் - குருநாகல்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நலையியற்கட்ளை இலக்கம் 119 (4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series - 79

Name of the institution – Kurunegala

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order No 119(4)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු කතා මාලා අංක - 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම්	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියා මාර්ග /වර්තමාන ප්‍රගතිය
පළමු කොටස : 98.00	
01. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 04 ක් වත් පවත්වා නොතිබීම.	2022 වර්ෂයේදී විගණන හා කළමණාකරණ කමිටු 03ක් පහත සඳහන් දිනවලදී පවත්වා ඇත. පළමු කාර්තුව සඳහා - 2022.04.27 තෙවන කාර්තුව සඳහා - 2022.09.29 හතරවන කාර්තුව සඳහා - 2022.12.08 දෙවන කාර්තුව සඳහා දිස්ත්‍රික් විගණන හා කළමණාකරණ කමිටුව 2022.06.29 වන දින පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර තිබුණත් එම වකවානුවේ රටේ පැවති අර්බුදකාරී තත්වය හේතුවෙන් ක්ෂණිකව අවලංගු කිරීමට සිදුවිය. නමුත් 02 වන කාර්තුවට අදාලව කමිටුවේ සාකච්ඡා කල යුතු කරුණු ද සමගින් 2024.09.29 වන දින තෙවන කාර්තුවට අදාල දිස්ත්‍රික් විගණන හා කළමණාකරණ කමිටුව නියමිත පරිදි පවත්වන ලදී. 2023 වර්ෂයේදී කමිටු 04 ම පවත්වා ඇති අතර 2024 වර්ෂයට අදාළව දෙවන කාර්තුව අවසාන වන විට, පළමු හා දෙවන කාර්තු 02 සඳහා පැවැත්විය යුතු දිස්ත්‍රික් විගණන හා කළමණාකරණ කමිටු 02 ම පවත්වා ඇති බව දන්වා සිටිමි.

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම්	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියා මාර්ග /වර්තමාන ප්‍රගතිය
දෙවන කොටස : **96.00**	
01. මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබීම.	1. 2022 වර්ෂයේ ආරම්භයේ දී මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නියමිත දින පිළිබඳව සැලසුම් කිරීම හා එම දිනයන් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන් වෙත ලබා දීම ද සිදු කරන ලදී. 2. එම වසරේ රට තුළ පැවති දේශපාලන අරගල තත්ත්වය හේතුවෙන් දේශපාලන නියෝජිතයින් වෙත එල්ල වී තිබූ ජීවිත තර්ජන නිසා රැස්වීම්වලට සහභාගී නොවීම, කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන්ගේ මාරු වීම් සිදු වීම, වර්ෂය අවසන් කාර්තුවේදී සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම ආදී හේතු පදනම් කර ගනිමින් වර්ෂය මූලාරම්භයේ සැලසුම් කළ පරිදි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි විය. 3. 2022 වර්ෂයේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් **03** ක් (2022.02.15, 2022.03.16 හා 2022.09.30) පමණක් පැවැත්වූ නමුත් 2023 වර්ෂයේදී සම්බන්ධීකරණ කමිටු රැස්වීම් **07** ක් (2023.03.03, 2023.03.30, 2023.05.17, 2023.06.28, 2023.07.26, 2023.09.26 හා 2023.12.27) පවත්වන ලදී. 2023.10.10 වන දින පැවැත්වීමට නියමිතව පැවති දිස්ත්‍රික් සම්බනධීකරණ කමිටු රැස්වීම දේශපාලන අධිකාරියේ වාචික දැනුම් දීමකින් අනතුරුව නොපවත්වන ලදී.

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම්	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියා මාර්ග /වර්තමාන ප්‍රගතිය
	4. මේ වන විටත් 2024 වර්ෂය සඳහා සම්බන්ධීකරණ කමිටු රැස්වීම් **05** ක් (2024.01.17, 2024.02.22, 2024.05.14, 2024.06.11 හා 2024.07.30) පැවැත්වීමට කටයුතු කරන ලදී. එමෙන් ම 2024.04.02 දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීම සඳහා සියලු කටයුතු සූදානම් කළ ද 2024.03.27 පුත්තලම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා නිලධාරීන් සහභාගී නොවීම හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා ද නිලධාරීන්ගේ සහභාගීත්වය අවිනිශ්චිත වීම නිසා රැස්වීම නොපවත්වන ලදී. 5. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් ලෙස දිස්ත්‍රික් ලේකම් කටයුතු කරන අතර එහි සම සභාපතිවරුන් ලෙස ගරු වයඹ පළාත් ආණ්ඩුකාරතුමා සහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු කටයුතු කරනු ලබයි. මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සඳහා දින නියම කරනු ලබන්නේ දේශපාලන අධිකාරිය විසින් බැවින් එම දින වලදී රැස්වීම පැවැත්වීම සිදු කරනු ලබයි. සම සභාපතිවරුන් මෙන්ම මහජන නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් තොරව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීම කළ නොහැකි බැවින් නියමිත පරිදි මාසිකව සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීමට නොහැකි වූ බව කාරුණිකව දන්වමි.

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම්	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියා මාර්ග /වර්තමාන ප්‍රගතිය
02. ආයතනයේ ගිණුම් පිලිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ වීම.	
පහත සඳහන් කරුණුවලින් සිදුවන බලපෑම හැර 2022 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව විගණකාධිපතිගේ මතය ලෙස දක්වා ඇත.	
2.1 මූලධන වියදම් ACA-2(i) ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම සඳහා වූ වියදම රු.39,81,462 ක් ලෙස දක්වා ඇතත්, භාණ්ඩාගාර SA-82 ආකෘතිය අනුව එම වියදම රු.4,110,007 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 128,545 ක වෙනසක් තිබුණි.	පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වහලය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය වූ රු.128,545.00 ක මුදල භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල ආරම්භක ශේෂයට ගැලපුම් කර නිවැරදි කර ඇති අතර 2023 වර්ෂ අවසානයේදී එය දෙපාර්තමේන්තු පොත් සමඟ සැසඳේ.
2.2. මූල්‍ය නොවන වත්කම් (අ) කුලියාපිටිය නැගෙනහිර, උඩුබද්දාව මාස්පොත, මල්ලවපිටිය, රස්නායකපුර හා ගල්ගමුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් ස්ථාපිත කර ඇති ඉඩම්වල වටිනාකම තක්සේරුකර දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	පෙන්වා දී ඇති කුලියාපිටිය (නැගෙනහිර), උඩුබද්දාව, මාස්පොත, මල්ලවපිටිය,රස්නායකපුර හා ගල්ගමුව යන සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්ථාපිත කර ඇති ඉඩම්වල වටිනාකම් තක්සේරු කර දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කර ඇත.
(ආ) රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරණ අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් සඳහා ලබාදී තිබූ ජල බවුසර් සහිත ලොරි රථ 04 පවරාගෙන තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි .	රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ලබා දී තිබූ ජල බවුසර් සහිත ලොරි රථ 04 ඉදිරියේදී ප්‍රාදේශීය සභා වෙත යැවීමට තීරණය කර ඇත. තවද මෙම ජල බවුසර් සහිත ලොරි රථ දිස්ත්‍රික් ලේකම් , කුරුණෑගල නමින් පවරාගතහොත් ඒ සඳහා වැයවන සියලු නඩත්තු වියදම් හා ඉන්ධන

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම්	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියා මාර්ග /වර්තමාන ප්‍රගතිය
	වියදම් 272 වැය විෂය යටතේ සිදු කල යුතු බැවින් හා ඒ සඳහා අමතර ප්‍රතිපාදනයක් නොලැබීම හේතුවෙන් පවරා ගැනීමට කටයුතු නොකරන ලදී.
(ඇ) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දී තිබුණු ට්‍රැක්ටර් බවුසර ට්ලෙර් රථ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පවරා දීමට කටයුතු කර තිබුණ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19ක් වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් හා බවුසර් ට්ලෙර් රථ 25ක් සහ ආපදා කළමණාකරණ අමාත්‍යාංශය හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් හා ට්ලෙර් රථ 20ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණද එම වත්කම්වල අගය තක්සේරුකර ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.	ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී තිබූ සියලුම ට්‍රැක්ටර් හා ට්ලෙර් රථ පවරාගෙන ගිණුම් ගත කිරීමේ කටයුතු අවසන් කර ඇත.
(ඈ) වැය විෂය අංක 2509 යටතේ ගම සමග පිලිසඳර වැඩසටහන මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදුකරන ලද ගොඩනැගිලි, සේවා පියස / නිල සෙවන ඇතුළු වෙනත් ඉදිකිරීම් සුදුසු පරිදි පවරාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්වීමට කටයුතු කර නොතිබුණි.	ගම සමඟ පිළිසඳර ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදු කරන ලද ගොඩනැගිලි, සේවා පියස/ නිල සෙවන ඇතුලු වෙනත් ඉදිකිරීම් සියල්ලෙහි වටිනාකම් ගිණුම් ගත කිරීමේ කටයුතු අවසන් කර ඇත.
(ඉ) නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අළුත්ම තත්ත්වයේ පවතින අංග සම්පූර්ණ නිල නිවස රු. 6,229,500 ක වටිනාකමට තක්සේරු කර ඇතත්, එම තක්සේරු වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතින නිල නිවස තක්සේරු කොට වටිනාකම ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ ගිණුම් ගත කර ඇත.
(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම දෙපාර්තමේන්තු පොත් අනුව රු.12,626,297 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශණවල රු. 11,539,037 ලෙස දැක්වීම හේතුවෙන් රු. 1,087,260ක් අඩුවෙන් දක්වා තිබුණි.	විගණනයෙන් පෙන්වා දී ඇති මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් වටිනාකම්හි දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය නිවැරදි වන අතර භාණ්ඩාගාර SA-82 ආකෘතිය අනුව භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල ආරම්භක ශේෂයේ එකතු කිරීම් යටතේ ගැලපුම් කර ඇති

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම්	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියා මාර්ග /වර්තමාන ප්‍රගතිය
	හෙයින් වෙනස්කම් හටගෙන ඇත. කෙසේ වෙතත් වර්ෂය අවසානයේ වාහන,ගොඩනැගිලි හා ඉදිකිරීම් , යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යන මූල්‍ය නොවන වත්කම්හි දෙපාර්තමේන්තු පොත් අනුව අවසන් ශේෂයන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්හි අවසන් ශේෂයන් හා සැසඳෙන බව කාරුණිකව දන්වමි. තවද ඉහත වෙනස්කම් සියල්ල භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල නිවැරදි කිරීම 2023 දෙවන කාර්තුවේදී සිදු කරන ලදී.
(උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලට අයත් නිල නිවාස සම්බන්ධයෙන් ලබාදී ඇති වාර්තා අනුව, නිල නිවාස 34 ක තක්සේරු වටිනාකම රු. 97,575,925 ක් වුවද, මූල්‍ය ප්‍රකාශණවලට අනුව එම වටිනාකම රු. 81,697,976 ක් ලෙස දැක්වීමෙන් රු. .15,877,949 ක වටිනාකමක් අඩුවෙන් දක්වා ඇත.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 34 ක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති වටිනාකම රු. 81,697,976 ක් වන අතර එය නිවැරදි ලෙස ගිණුම් ගත කර ඇත. එය විගණනයේදී අප විසින් ලබා දී තිබූ අතර එහි වටිනාකම රු.81,697,976 ක් ලෙස පැහැදිලිව පෙන්වා තිබුණි. රු.81,697,976 ක් ලෙස අප විසින් ලබා දුන් වාර්තාව අනුව ගිණුම් ගත කල වටිනාකම නිවැරදි වේ.
(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් ගිණුමේ නේවාසික නොවන ගොඩනැගිලි ගිණුමේ සහ යන්ත්‍රෝපකරණ ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති අවසාන ශේෂයන් 2022 ජනවාර් 01 දිනට ආරම්භක ශේෂයන් අතර පිළිවෙලින් රු. 3,106,940 ක් වැඩියෙන්ද , රු. 32,180 ක් අඩුවෙන්ද වටිනාකම් දක්වා තිබුණි.	නේවාසික නොවන ගොඩනැගිලි හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වල 2022 වර්ෂය තුල සිදු කරන ලද එකතු වීම් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල ආරම්භක ශේෂයට ගැලපුම් කර ඇති බැවින් පෙන්වා දී ඇති වෙනස හටගෙන ඇත. කෙසේ වෙතත් වර්ෂය අවසානයේ නේවාසික නොවන ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල දෙපාර්තමේන්තු පොත් අනුව අවසන් ශේෂයන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්හි අවසන් ශේෂයන් හා සැසඳේ.
2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් දීර්ඝකාලීනව භාවිතයට ගනු ලබන නිල නිවාස 07ක් රු. 23,780,480 කට තක්සේරුකර ඇති බව දක්වා ඇතත්, අදාල වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම්	විගණනයෙන් පෙන්වා දී ඇති නිල නිවාස 07 ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුලම පිහිටා ඇති අතර ගිණුම් ගත කර ඇති කාර්යාල ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම තුල මෙම නිල නිවාසවල වටිනාකමද ඇතුලත් වී ඇත. ඒ අනුව රු. 23,780,480 කට තක්සේරු කර

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම්	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියා මාර්ග /වර්තමාන ප්‍රගතිය
යටතේ දක්වා නොතිබුණ අතර , එයට අදාල උපලේඛනවල ඇති ශේෂයන් සනාථ කර ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත්කර නොතිබුණි.	ඇති නිල නිවාස 07 හි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා ඇත.
(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුල පිහිටා ඇති නිළ නිවාස 07ක් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් භාවිතයට ගනිමින් පැවති අතර, මෙම නිල නිවාස තක්සේරු කර මූල්‍ය ප්‍රකාශණවල ඇතුලත් කිරීමට කටයුතුකර නොතිබුණු අතර, එයට අදාල උපලේඛනවල ශේෂයන් සනාථකර ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත්කර නොතිබුණි.	විගණනයෙන් පෙන්වා දී ඇති නිල නිවාස 07 ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුලම පිහිටා ඇති අතර ඒවායේ වටිනාකම් දැනටමත් ගිණුම් ගත කර ඇති කාර්යාල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් තුල ඇතුලත්ව ඇත. ඒ අනුව නිල නිවාස 07 හි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා ඇත.

ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කුරුණෑගල

ඩබ්.එම්.ආර්.සී. කුමාරි
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කුරුණෑගල.

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කුරුණෑගල

ආර්.එම්.ආර්. රත්නායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
කුරුණෑගල.

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් හෙළඳලෙක අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය